සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No } DDD/HO/06/M/02/09

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2016.11.22

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂවරුන් හා
සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත.

**සමෘද්ධි ජාතික වෙළඳ ප්‍රදර්ශනය**

**බත්තරමුල්ල දියත උද්‍යාන පරිශ්‍රය - 2016.12. 06, 07, 08**

උක්ත කරුණ සම්බන්ධයෙන් යොමු කරන ලද DDD/HO/06/MA/02/09 හා 2016.11.10 දිනැති ලිපියට අමතර වශයෙනි.

1. එක් දිස්ත්‍රික්කයට අදාල නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා (20'x10') කුටි 03ක් වෙන් කර දෙනු ලැබේ. (ආදර්ශ ගම්මානය සඳහා වෙන් කරනු ලබන කුටිය හැර) ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවනු ලබන ව්‍යවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදනයන්ද සැලකිල්ලට ගෙන ලබාදී ඇති ඉඩ ප්‍රමණයන් මනාව කළමනාකරණය කරගත හැකි වන අයුරින් ප්‍රදර්ශනය සඳහා ව්‍යවසායකයින් කීපදෙනෙකු ඉදිරිපත් කළ හැකිය.

   - තරඟය සඳහා ඉදිරිපත් විය හැක්කේ දිස්ත්‍රික්කය විසින් නම් කර එවනු ලැබූ ව්‍යවසායකයින් 04 දෙනෙකු පමණක් බවත්, සෙසු ව්‍යවසායකයින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමටත් පියවර ගත යුතුය.

   - ඔබ විසින් තරඟය සඳහා තෝරා නම් කර එවනු ලබන ව්‍යවසායකයින් 04 දෙනාට තම නිෂ්පාදන තරඟයකට උචිත වන අයුරින් ක්‍රමවත්ව හා අලංකාරව ඉදිරිපත් කිරීමට අනෙකුත් ව්‍යවසායකයින් බාධාවක් නොවිය යුතුය.

   - ආදර්ශ ගම්මාන වලින් ඉදිරිපත් වන ව්‍යවසායකයින් තරඟය සඳහා ඉදිරිපත් කරනු නොලැබේ.

   - ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවනු ලබන ව්‍යවසායකයින් ගේ නාම ලේඛනය නොපමාව අලෙවි අංශය වෙත ලබා දිය යුතු වේ.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ )පාලන( / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

- කිසිදු අයුරකින් එම අවස්ථාවේදීම ආහාර හෝ පානවර්ග සකසා දෙන වෙළඳුන් සහභාගි නොකිරීමට වග බලා ගත යුතුය.

- දිස්ත්‍රික් කාර්යාලයේ අලෙවි / ජීවනෝපාය / ව්‍යාපෘති විෂය කළමණාකරු වෙළඳුන් භාරව ප්‍රථම දිනයේදී පැමණීම අනිවාර්ය වේ

- දිස්ත්‍රික් නිලධාරීන් උපරිම තිදෙනෙක් සඳහා (රියදුරු මහාතාද ඇතුළුව) නවාතැන් ලබාදීමට අපේක්ෂා කරන බැවින් සහභාගීවන නිලධාරීන් පිළිබඳව කලින් දැනුම් දීම වඩාත් පහසුය.

- වෙළඳ භාණ්ඩ එල්ලා තැබීම, රඳවා තැබීම වැනි කාර්යයන් සඳහා වෙළඳ කුටිය තුල කිසිදු ආධාරකයක් නොමැති අතර ඒ සඳහා වෙළඳ කුටියේ කණු හෝ වහලය භාවිතා කිරීමට අවසර දෙනු නොලැබේ.

- ව්‍යවසායකයින්ගේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ප්‍රවාහන පහසුකම් සපයන බැවින් දින තුනක් සඳහා ප්‍රමාණවත් වෙළඳ භාණ්ඩ රැගෙන ආ යුතුය.

- ව්‍යවසායකයින් සඳහා නවාතැන් පහසුකම් බොරැල්ල ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනයේ වෙන්කර ඇති අතර, එහි ඉඩ පහසුකම් එම ව්‍යවසායකයින් විසින් කළමනාකරණය කරගත යුතුය.

- ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ව්‍යවසායකයා සමඟ තවත් එක් අයෙකුට පමණක් පැමිණිය හැකිය.

- නිෂ්පාදනවල ආරක්ෂාව සඳහා රාත්‍රී කාලයේදී තමන්ගේ වෙළඳ කුටිය තුල එක් අයෙක් හෝ රැඳී සිටිය යුතුය.

- ප්‍රථම දින පෙ:ව: 10.00 වන විට වෙළඳ කුටි සූදානම් කර තිබිය යුතුය.

- භාණ්ඩ ඇසුරුම් කිරීමේදී හෝ වෙනත් කිසිදු අයුරකින් වෙළඳකුටි වලට හානි සිදු නොවන අයුරින් කටයුතු කළ යුතුය. එසේම වෙළඳකුටි හා උද්‍යාන පරිශ්‍රය පවිත්‍රව තබා ගැනීම හා කසල බැහැර කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බවට උපදෙස් ලබා දෙන්නේ නම් මැනවි.



නීල් හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්